**සංවර්ධන ලොතරැයි මණ්ඩලය - 2022**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විට දී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම.

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදු වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදු වන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේ ද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුව ද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේ ද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිත කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන්වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම.**

පහත සඳහන් නිරීක්ෂණයන් කරුණු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 69 වන ඡේදයට පටහැනි ලෙස පෙර වර්ෂයන්වලදී ජංගම වගකීම් ලෙස ඇස්තමේන්තුකර තිබූ රු.13,793,093 ක් සමාලෝචිත වර්ෂයේදී වෙනත් ආදායමක් ලෙස ගිණුම් ගතකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | මෙය පෙර වර්ෂයේ උපචිත වියදම්හි ඇස්තමේන්තුවල සිදුවූ වෙනස්කම් නිවැරදි කිරීමකි. | ශේෂ පත්‍ර දිනට ගෙවීමට ඉතිරිව ඇති ඉන්වොයිස් මත උපචිත වියදම් ගණනය කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 36 වන ඡේදය ප්‍රකාරව දේපල පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කිරීමේදී දේපල පිරියත උපකරණ අයත් පන්තියම ප්‍රත්‍යාගණනය කළ යුතු වුවද කාර්යාල උපකරණ, ලී බඩු හා සවිකිරීම් යන වත්කම් පන්ති දෙකට අයත් එකතු වටිනාකම රු.56,204,125 ක්වූ වත්කම්වලින් රු.11,707,714 ක්වූ වත්කම් පමණක් ප්‍රත්‍යාගණනය කර තිබූ අතර එකතු වටිනාකම රු.44,496,411 ක් වූ වත්කම් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. | විගණන වාර්තාවේ පෙන්වා දුන් අගයන් ද සැලකිල්ල ට ගෙන මණ්ඩලයේ සියලු වත්කම් සඳහා විධිමත් ප්‍රත්‍යාගණනයක් 2023 වර්ෂයේ සිදුකිරීමට නියමිත ය. | අදාල ප්‍රමිතියට අනුව දේපල, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කරයි නම් එය අයත් මුළු පන්තියේම වත්කම් ප්‍රත්‍යාගණනය කළ යුතු වීම. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරුණු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දැනට ඉදිකිරීම් අත්හිටුවා ඇති කාර්යයක් වෙනුවෙන් සැලසුමක් සකස් කිරීමට වැයකර තිබුණු එකතුව රු1.,728,884ක් වූ වියදම සඳහා අවශ්‍ය ගිණුම්කරණ ගැලපීම් සිදු නොකර වර්ෂ 08 ක් තිස්සේ දේපල පිරියත හා උපකරණ යටතේ කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම් ගත කර තිබුණි. | ගිණුම්කරණ ප්‍රමිත LKAS 16 ප්‍රකාරව වත්කමක් ලෙස හඳුනාගැනීම සඳහා අදාල වත්කම ප්‍රතිලාභ ලැබෙන මට්ටමට නිමවී තිබිය යුතුය. (It is Probable that Future economic benefits associated with the item will flow to the entity.) එබැවින් 2022 දෙසැම්බර් 31 දින වන විටත් ඉහත ඉදිකිරීම් නිම වී නොතිබුණි. | මෙම ඉදිකිරීම සිදුකිරීමට අදහස් නොකරයි නම් මෙම ශේෂය කෙරීගෙන යන වැඩ ගිණුම තුල තබාගැනීම අවශ්‍ය නොවන බැවින් ඒ සඳහා ගිණුම්කරණ ගැලපීම් සිදු කළ යුතු වීම. |
| (ආ) | මණ්ඩලයේ වර්ෂයේ ආදායම් 2022 බදු වියදම ගණනය කිරීමේදී මුල් අර්ධ වර්ෂයේ බදු අයවිය යුතු ලාභය ක අනුපාතයක් සහ 24 මත සියයට දෙවන අර්ධ වර්ෂයේ බදු අයවිය යුතු ක අනුපාතයක් 30 ලාභය මත සියයට වුවත් අදාල කර ගත යුතු, මණ්ඩලය විසින් සම්පුර්ණ වර්ෂයේ බදු අයවිය යුතු ලාභය මත සියයට 30 බදු අනුපාතයක් අදාල කර ගැනීම නිසා සමාලෝචිත වර්ෂයේ ආදායම් බදු වියදම රු.6,127,600 කින් වැඩිපුර ගිණුම්ගත කර තිබුණිමේ නිසා . සමාලෝචිත වර්ෂයේ බදු පසු ලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් ගණනය වී තිබුණි. | වාර්ෂික ආදායම් බද්ද ගණනය කිරීම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කරනු ලබන අවස්ථාවේදී නිශ්චිතවම ගණනය කළ නොහැකි බැවින් ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත (LKAS) 12 අනුව ඒ සඳහා ඇස්තමේන්තුවක් මත පදනම්ව වෙන්කිරීමක් පමණක් සිදුකරනු ලැබේ. වාර්ෂික ආදායම් බද්ද නිශ්චිතව ගණනය කර ගෙවීම් කිරීම සඳහා ඊළඟ මූල්‍ය වර්ෂයේ සැප්තැම්බර් මස 30 වන දින දක්වා කාලයක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇත.<br><br>ඒ අනුව අප විසින් 2023 සැප්තැම්බර් 30 දිනට පෙර නියමිත පරිදි මුල් මාස 09 හා අවසාන මාස 03 සඳහා ආදායම් වියදම් සලකා බලා වෙන වෙනම ගණනය කිරීමක් සිදුකර අදාළ නියමිත බදු ප්‍රතිශතය අනුව ගෙවීම් සිදුකරනු ලැබේ. | මේ සම්බන්ධයෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් කරුණු විමසා ඒ අනුව කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | ජංගම නොවන වත්කම් තුල ඇතුලත් රු8.,095, 000ක් වටිනා කැබ් රථයක් හිටපු සභාපතිවරයකු විසින් රැගෙන යෑම නිසා භෞතිකව මණ්ඩලය සතුව නොතිබුණි. | මෙම මෝටර් රථය මණ්ඩලය නමින් ලියාපදිංචි කර ඇත. මෙම ලියාපදිංචිය පදනම්කරගෙන අදාළ වත්කම 2012 වර්ෂයේ දී ප්‍රාග්ධනිත කර ඇත. | මෙම වාහනය මණ්ඩලය වෙත භෞතිකව ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2017 සහ 2021 වර්ෂයන්හිදී ලොතරැයිපත් විකුණුම් ආදායම් වශයෙන් සලකා ගිණුම්ගත කර තිබුණු එකතුව රු.840,343 ක්වූ ලොතරැයිපත් නොවිකුණා ආපසු එවීම් වශයෙන් සලකා සමාලෝචිත වර්ෂයේදී අදාල බෙදාහැරීමේ නියෝජිතයන් වෙත මුදල් ගෙවා, ආපසු එවුම් ලෙස රු.616,743 ක් හා වාහන නඩත්තු වියදම් ලෙස රු.223,600 ක් වශයෙන් ගිණුම්ගතකිරීම හේතුවෙන්, සමාලෝචිත වර්ෂයේ ලාභය රු.840,343 ක් අඩුවෙන් දක්වා තිබුණි. | මෙම විගණන විමසුමෙන් පෙන්වා දී ඇති පරිදි මෙම ටිකට් තොග සඳහා ගෙවීම 2022 වර්ෂයේ සිදුකර ඇත.<br><br>එම මුදල තුළ ඇතුළත් රු.223,600 ක මුදල වැරදීමකින් වාහන නඩත්තු වියදමක් වශයෙන් ගිණුම්ගත කර ඇති අතර මෙවැනි වැරදි ඉදිරියේදී සිදු නොවීමට කාර්ය මණ්ඩලයට අදාළ උපදෙස් ලබා දී ඇත. | පෙර වර්ෂ ගැලපීම් ලෙස හඳුනාගෙන ගිණුම් ගත කළ යුතු වීම. |

## 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

පහත සඳහන් නිරීක්ෂණයන් කරුණු ලැබේ.

| | විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. | වෙනස රු. | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| (අ) | **ගෙවිය යුතු ශේෂ** | | | | අදාළ මාධ්‍ය ආයතන ලබා දුන් තොරතුරු නිසි සැසඳුමක් කර මෙම වෙනසට හේතු වූ කරුණු පෙන්වා දීමට කටයුතු කරනු ලැබේ. | අදාළ ආයතන සමහ සාකච්ඡා කර එම ශේෂ නිරවුල් කරගැනීමට කටයුතු කළ යුතු වීම. |
| | - ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව | 13,758,998 | 17,593,053 | 3,834,055 | | |
| | - ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව | 39,230,000 | 45,150,000 | 5,920,000 | | |
| | - සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම | 12,005,909 | 1,946,541 | 10,059,368 | | |
| (ආ) | ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවෙන් අයවිය යුතු | නැත. | 1,921,681 | 1,921,681 | - එම - | - එම - |

**1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම.**

| විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| ජංගම නොවන වත්කම්වලට අදාළ පරිගණකගත මූලික ලේඛණයේ ඇතුළත් පරිගණක සහ කාර්යාල උපකරණ අයිතම පිළිබඳ තොරතුරු | 6,631,587 | පරිගණක සහ කාර්යාල උපකරණහි අයිතම ප්‍රමාණය, පිරිවැය හෝ ප්‍රත්‍යාගණන වටිනාකම , මිලදී ගත් දිනය | ස්ථාවර වත්කම්වල පවතින දෝෂ හඳුනාගැනීමට මණ්ඩලය විසින් පත්කල කමිටුවක් විසින් විගණන විමසුමේ සඳහන් රු.4,107,599 වන පරිගණක සහ උපාංගවල ශේෂය ඉවත් කිරීමට නිර්දේශ වූ අතර, එම නිර්දේශය විගණන හා කළමණාකරන කමිටුව හරහා අධ්‍යක්ෂක මණ්ඩලයට යොමු කර ගිණුම් තුලින් ඉවත් කිරීමට අනුමැතිය මේ වන විට ලැබී ඇත. මෙහි පෙන්වා දී ඇති රු.2,523,988 වන කාර්යාල උපකරණ සම්බන්ධයෙන් කමිටුවේ නිර්දේශ සකස් වෙමින් පවතී. | ස්ථාවර වත්කම් පිළිබඳ ලේඛන පවත්වා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරුණු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සංවර්ධන ලොතරැයි මණ්ඩලය ණය පදනම මත ඉන්ධන ලබාගැනීමේදී නැවත අයකර ගැනීමේ පදනමින් 2003 නොවැම්බර් 13 දින සහ 2008 අප්‍රේල් 26 දින ආයතන දෙකක පිළිවෙලින් රු.75,000 ක් සහ රු.100,000 බැගින් එකතුව රු.175,000 ක මුදලක් තැන්පත්කර තිබූ අතර, එම ආයතන දෙක සමඟ ගණුදෙනු කිරීම නවතා වර්ෂ ගණනාවක් ගතවී තිබුණු නමුත්, එම තැන්පතු මුදල් සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම නැවත අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම ඇප තැන්පතු ගාස්තු සඳහා අදාළ කාල සීමාව අවසානයේ ලබා ගත් ඉන්ධන සඳහා හිලව් කර ඇති බව නිරීක්ෂණය වේ. නමුත් එම තැන්පතු මුදල් ගිණුම් වලින් ඉවත් වීමක් සිදු වී නොමැති බව නිරීක්ෂණය වේ. මේ පිළිබඳව නැවත විමර්ශනය කර අදාළ තොරතුරු සමඟ ගැලපීමෙන් පසුව නිවැරදි සටහන් තැබීම හෝ අදාළ මුදල් ආපසු ලබා ගැනීමට කටයුතු කරනු ඇත. | මෙම ලැබිය යුතු ශේෂය සම්බන්ධයෙන් පරීක්ෂා කර අදාළ ගිණුම්කරණ ගැලපීම් සිදුකළ යුතු වීම. |
| (ආ) | මණ්ඩලය විසින් වොක්ෂෝල් වීදියේ අංක 234 දරන ගොඩනැගිල්ල 2006 ඔක්තෝබර් මාසයේ සිට කුලී පදනම මත ලබාගැනීම සඳහා එළඹුණු ගිවිසුම ඒකපාර්ශිකව කඩ කර තිබීම නිසා තැන්පතු මුදල ලෙස ගෙවූ රු.723,780 ක් හා එම වර්ෂයන් සඳහා ගෙවූ කුලී මුදලින් | අදාළ සියලු තොරතුරු මේ වන විට නීතිපති දෙපාර්තමේන්තුව වෙත ලබා දී ඇත. ඒ අනුව නීතිපති දෙපාර්තමේන්තුව විසින් මීළඟට ගනු ලබන නීති ක්‍රියාමාර්ග සඳහා අවශ්‍ය සහයෝගය මණ්ඩලය මඟින් ලබාදෙනු ඇත. | මෙම මුදල කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | කොටසක් වන රු.4,976,220 ක් යන මුදල්වල එකතුව වන රු.5,700,000 ක් දැනට වර්ෂ 16 ක් මුළුල්ලේ අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | | |
| (ඇ) | 1990 වර්ෂයේ වෝඩ් පෙදෙසේ පුද්ගලයෙකු සමඟ ඇතිකරගෙන තිබූ කුලී ගිවිසුම ප්‍රකාරව රු.2,520,000 ක ගොඩනැගිලි කුලී තැන්පතු මුදලක් අයකර දෙන ලෙස ඉල්ලා අවුරුදු 23 කට පෙර ගොනුකර තිබූ නඩුවේ තීන්දුව 2016 ජනවාරි 11 දින ලැබී තිබුණි. අදාළ මුදල අයකර ගන්නා ලෙස නඩු තීන්දුව ප්‍රකාශ වී වර්ෂ 06 කට ආසන්න කාලයක් ගත වී තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් එම මුදල අයකර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි. | එම නඩු තීන්දුව පිළිබඳ නැවත අභියාචනයක් අදාළ විත්තිකරු විසින් සිදු කර ඇත. එම අභියාචනයට අදාළ අධිකරණ ක්‍රියාමාර්ග පවතින අතරතුර විත්තිකරු මියගොස් ඇත. මේ හේතුවෙන් විත්තිකරු වෙනුවට ඔහුගේ බිරිඳ හා පුත්‍රයා ආදේශිත වග උත්තරකරුවන් ලෙස මෙම නඩුවට අදාළ කර ගැනීම සඳහා වන නොතිසි කොළඹ හා ගල්කිස්ස අධිකරණ මගින් විත්තිකරුවන් වෙත භාරදීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. | මෙම මුදල කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඈ) | 2013 වර්ෂයේ අවස්ථා 03 කදී රු.2,877,144 ක් සහ 2014 වර්ෂයේදී රු.749,583ක් වශයෙන් එකතුව රු.3,626,727 ක් පෞද්ගලික ආයතනයක් වෙත ගොඩනැගිලි සැලැසුම් උපදේශන ගාස්තු අත්තිකාරම් වශයෙන් ගෙවා තිබුණි. වර්ෂ 09 කට අධික කාලයක් තුළ අපේක්ෂිත කාර්යයන් ඉටුකරවා ගැනීමකින් තොරව මණ්ඩලයේ අරමුදල් බාහිර පාර්ශවයකට රඳවා ගැනීමට මණ්ඩලය විසින් ඉඩ ප්‍රස්ථා ලබා දී තිබුණි. | සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අභ්‍යන්තරයේ සිදු කිරීමට අවශ්‍ය වූ ඉදිකිරීම් සම්බන්ධව සැලසුම් සකස් කර ගැනීමට පෞද්ගලික උපදේශන ආයතනයක් වෙත අත්තිකාරම් ගාස්තු ලෙස රු.3,626,727 මුදලක් ගෙවා ඇත. මෙම ගෙවීම පිළිබඳව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වලදී දීර්ඝව සාකච්ඡා කළ අතර එම ගෙවන ලද මුදල් නැවත අය කර ගැනීමේ හැකියාවක්ද නොමැති බැවින් කපා හැරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස උපදෙස් ලබා දෙන ලදී. ඒ අනුව මූල්‍ය රෙගුලාසි 104 ප්‍රකාරව මෙම මුදල කපාහැරීම හෝ නැවත අය කර ගැනීම සඳහා අවශ්‍ය නිර්දේශ ලබා ගැනීමට අභ්‍යන්තර කමිටුවක් පත් කර වාර්තාවක් සකස් කර එම වාර්තාවේ ඇතුළත් නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත.<br>2022 මාර්තු 10 වන දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී මේ සම්බන්ධව වාර්තාවක් සකස් කර එවන ලෙස ලබා දුන් උපදෙස් අනුව 2022 ජුනි 15 දිනැතිව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ ලේකම් වෙත වාර්තාවක් යොමු කර ඇත. | අදාළ ආයතනයෙන් මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

### 1.6.2 අත්තිකාරම්

පහත සඳහන් නිරීක්ෂණය කරුණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2015 වර්ෂයේ දැයට කිරුළ වැඩසටහන සඳහා නවාතැන් පහසුකම් ලබා ගැනීමට 2014 වර්ෂයේදී එක් ආයතනයක් හා පුද්ගලයින් තිදෙනෙකු වෙත එකතුව රු.202,800 ක අත්තිකාරම් ගෙවා තිබුණි. වර්ෂ 08 ක කාලයක් මුළුල්ලේ මණ්ඩලයේ අරමුදල් බාහිර පාර්ශවයන් වෙත රඳවා ගැනීමට ඉඩදී තිබුණු අතර, එම මුදල් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් අයකර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි. | මේ සඳහා අදාළ සියලු පාර්ශව හමු වී වාරික වශයෙන් හෝ මෙම මුදල් අය කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ඇත. | අත්තිකාරම් මුදල් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. |

### 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.

පහත සඳහන් නිරීක්ෂණයන් කරුණු ලැබේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මණ්ඩලය විසින් එකතුව රු.1,728,541,094 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබූ නමුදු ඒ සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබාගෙන නොතිබුණි. | මණ්ඩලයේ අරමුදල් කළමණාකරණය තුළින් සැලකිය යුතු පොලී ආදායමක් උපයන අතර එම ආදායම ජනාධිපති අරමුදලට ප්‍රේෂණය කරයි. 2022 මූල්‍ය වර්ෂය වෙනුවෙන් රු.මිලියන 273 පොලී ආදායමක් උපයා ඇත. කෙසේ නමුත් පෙන්වා දී ඇති අඩු පාඩු නිවැරදි කිරීමට ඉදිරියේදී පියවර ගනු ලබයි. | 1971 අංක 38 දරන මුදල් පනතේ ඇති විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ආ) | 1997 අංක 20 දරන සංවර්ධන ලොතරැයි මණ්ඩල පනතේ 17(5) වගන්තිය | ත්‍යාගලාභීන් හිමිකම් නොපෑ, මාස 06 ක කාලසීමාව ඉකුත් වූ ත්‍යාග සඳහා මිලදීගත් භාණ්ඩ විකිණීමෙන් ලැබෙන මුදල පළමු කොට අරමුදලටද, ඉන් පසුව ජනාධිපති අරමුදලටද බැරකළ යුතු වුවත්, 2018 සහ 2020 වර්ෂයේදී ත්‍යාග වශයෙන් ලබාදීමට මිලදී ගත් එකතු වටිනාකම රු.779,750 ක්වූ යතුරු පැදි තුනක් අලෙවි කර එම මුදල් පනත ප්‍රකාරව යෙදවීමට | ජනාධිපති කාර්යාලයට මිලදී ගැනීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදුවෙමින් පවතින අතර ජුනි මාසය තුල මෙම යතුරු පැදි 03 ජනාධිපති කාර්යාලය විසින් මිලදී ගනු ඇත. | 1997 අංක 20 දරන සංවර්ධන ලොතරැයි මණ්ඩල පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | සමාලෝචිත වර්ෂයේ මැයි 30 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබාදී තිබුණද, අදාල කටයුතු වර්තමානය වනවිටත් සිදුකර නොතිබුණි. | | |
| (ඇ) | 2019 දෙසැම්බර් 17 දිනැති අංක 08/2019 දරණ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තු චක්‍රලේඛය | දිනට පෙර 31 ජනවාරි 2020 රාජ්‍ය සංස්ථා ඇතුළු රාජ්‍ය ආයතන www.promise.lk වෙබ් අඩවිය යටතේ හඳුන්වා දී ඇති විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රමවේදය )e – GP) යටතේ ලියාපදිංචි විය යුතු වුවත්, සංවර්ධන ලොතරැයි මණ්ඩලය මෙම ක්‍රමවේදය යටතේ ලියාපදිංචි වී නොතිබුණු බැවින් , ඒ අනුවප්‍රසම්පාදන කටයුතු සිදු කර නොතිබුණි. | මේ වන විට මෙම ආයතනය විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රමවේදය (e – GP) සඳහා ලියාපදිංචියට ඉල්ලුම් කොට ඇත. එම ලියාපදිංචිය සිදු කිරීමෙන් පසුව මෙම ආයතනයට එකී විද්‍යුත් ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමණය කිරීමේ හැකියාව ඇත. | අදාළ චක්‍රලේඛ විධිවිධානය අනුව කටයුතු කළ යුතු වීම. |
| (ඈ) | දෙසැම්බර් 2008 දිනැති අංක 31 දරණ අයවැය 42 ලේඛයචක්‍ර | නිලධාරීන් ක් වෙත 147 රු 250,000.ණය සීමාව ඉක්මවා එකතුව රු 9,867,854.ක මුදලක් ආපදා ණය ලෙස ලබාදී තිබුණි. | විගණනය මගින් 2022 වසරේ පෙන්වා දීමෙන් පසුව චක්‍රලේඛයේ සඳහන් පරිදි රු.250,000 ඉක්මවා නොයන පරිදි ආපදා ණය ලබා දීමට කටයුතු කර ඇත. ඒ අනුව 2022 අගෝස්තු මාසයෙන් පසුව කිසිදු කාර්ය මණ්ඩල සාමාජිකයෙකුට අදාල සීමාව ඉක්මවා ආපදා ණය මුදලක් ලබා දීමක් සිදු කර නොමැත. | අදාළ චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතු වීම. |
| (ඉ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය2006 | | | |
| | (I) 4.3 වගන්තිය | (i). සියලුම ආශ්‍රිත වියදම් ඇතුලු මුළු පිරිවැය ඇස්තමේන්තුව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් පිළියෙල කර ඒ සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අනුමැතිය ලබාගත යුතු වුවද වටිනාකම රු. මිලියන 9.125 ක්වූ දිවයින පුරා අලෙවි කුටි 200 ක් නැවත සන්නම් කිරීම සහ ලොතරැයි අලෙවි කුටි 25 ක් අළුතින් සකස්කිරීමේ ප්‍රසම්පාදන කාර්යය සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබුණි. | ඉදිරි ප්‍රසම්පාදන අවශ්‍යතා සඳහා විගණනයේ පෙන්වා දීම් අදාළ කර ගනු ලැබේ. | අදාළ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | (ii). ලොතරැයි වර්ග 07 ක් මුද්‍රණය කරවා ගැනීමේ පිරිවැය ඇස්තමේන්තු එක් එක් ලොතරැයිය වෙනුවෙන් වෙන්වෙන්ව පිළියෙල කර ලංසු කැඳවීම දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව යටතේ සිදුකර තිබුණද, එම ප්‍රසම්පාදන ක්‍රියාවලිය අමාත්‍යාංශ ප්‍රසම්පාදන හෝ අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව මගින් සිදුකළ යුතු බව දක්වමින් ප්‍රසම්පාදන කටයුතු අවලංගු කර තිබුණි. | විගණනය විසින් දක්වා ඇති කරුණු දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් ගෙන ඇති තීරණයක් බැවින් ඒ පිළිබඳව වැඩිදුර පැහැදිලි කිරීමක් සිදුකල නොහැක. | අදාළ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ii)<br>වගන්තිය 4.2.3 | ප්‍රසම්පාදන කටයුතුවල එක් එක් පියවරයන් සඳහා ගතකරන කාලය නිවැරදිව තීරණය කරමින් එම කාලවකවානු තුළ අදාළ කාර්යයන් සම්පූර්ණ කිරීමට කටයුතු කළයුතු වුවත්, තෙවන වරට 2022 පෙබරවාරි මාසයේදී ආරම්භකර තිබූ ලොතරැයි වර්ග 08 ක් මුද්‍රණය කරවාගැනීමට අදාළ ප්‍රසම්පාදන කටයුතු 2023 මාර්තු අවසානය වන විට වසර 01 යි මාස 01 ක් ගතවී තිබුණද සැපයුම්කරුවකු වෙත ලංසු ප්‍රදානය කිරීමට අපොහොසත් වී තිබුණි. | මීට අදාළ ලංසු පැවරීම 2023 අප්‍රේල් 21 දින සිදුකර ඇති අතර නව සැපයීම ආරම්භ කිරීම 2023 මැයි 16 දින සිට සිදුවන අයුරින් ලංසු පැවරීම සිදුකරමින් පවතී. ඒ අනුව සංශෝධිත ප්‍රසම්පාදන කාලසටහනට අදාළ ලංසු පැවරීම සිදුකර ඇත. | අදාළ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.3,266,591,501 ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.2,953,528,558 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.313,062,943 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ලොතරැයිපත් විකුණුම් ආදායම සහ ආයෝජන පොලී ආදායම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

(අ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී ලොතරැයිපත් විකුණුම් ආදායම රු.3,707,058,253 කින් හෙවත් සියයට 24 කින් වැඩිවී තිබුණි. එසේම ආයෝජන පොලී ආදායම රු.81,603,744 සිට රු.233,746,005 ක් දක්වා සියයට 185 කින් වැඩිවීම හේතුවෙන් වෙනත් ආදායම රු.110,304,701 සිට රු.320,846,644 දක්වා වැඩිවී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව ලොතරැයිපත් පිරිවැය රු.433,523,004 සිට රු.844,240,759 දක්වා සියයට 95 කින් වැඩිවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණය කරුණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| හිටපු සභාපතිවරයෙකු විසින් 2008 අප්‍රේල් 22 දින පෞද්ගලික ආයතනයකින් රැගෙන ගොස් තිබුණු කැබ් රථයක් වෙනුවෙන් එම ආයතනය වෙත කැබ් රථයේ වටිනාකම සහ එම මුදලට අදාළ නෛතික පොළිය ලෙස රු.14,923,369 ක් සහ නීතිඥ ගාස්තු ලෙස රු.245,000 ක් වශයෙන් එකතුව රු.15,168,369 ක් මණ්ඩලය විසින් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් මණ්ඩලය විසින් පැවරූ නඩුව 2022 වර්ෂය අවසානය දක්වාම අවසන් වී නොතිබුණු අතර, මේ සම්බන්ධයෙන් මණ්ඩලය වෙනුවෙන් පෙනී සිටින ලද නීතිඥයන් වෙත රු.1,674,185 ක්ද මණ්ඩලය විසින් ගෙවා තිබුණි. ඒ අනුව මෙම සිදුවීම සම්බන්ධයෙන් 2022 වර්ෂය අවසානය දක්වා මණ්ඩලය දරා තිබුණු මුළු වියදම රු.16,842,554 ක් විය. | මණ්ඩලයට මිලදී ගන්නා ලද WP-PB 6024 කැබ් රථයක් හිටපු සභාපතිවරයෙකු රැගෙන ගොස් තිබීම නිසා වාහනය මිලදී ගත් ආයතනයට මණ්ඩලය මුදල් නොගෙවීම නිසා එම පෞද්ගලික ආයතනය විසින් සංවර්ධන ලොතරැයි මණ්ඩලයට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම හේතුවෙන් මණ්ඩලය විසින් එම ආයතනයට රු.15,168,367 මුදලක් ගෙවීමට සිදු විය. එම නිසා කැබ් රථයේ වටිනාකම, නෛතික පොලිය, අදාළ ආයතනයෙන් දැරූ නීතිඥ ගාස්තු හා මණ්ඩලයේ නීතිඥ ගාස්තුව ලෙස රු.1,674,185 අලාභයක් මණ්ඩලයට සිදුව ඇත. මෙම මුදල අය කර ගැනීම සඳහා අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග නීතිපති දෙපාර්තමේන්තුවේ මගපෙන්වීම යටතේ ගෙන ඇති අතර මෙම නඩුවට අදාළ පලමු අධිකරණ දිනය 2022 මැයි 06 දින පැවති අතර, දෙවන අධිකරණ දිනය වශයෙන් 2023 අප්‍රේල් 07 වන දින පැවැත්විණි. | නීති ක්‍රියාමාර්ග තුලින් මණ්ඩලයට වූ මූල්‍යමය පාඩුව අදාළ පාර්ශ්වයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරුණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සන්නාම ප්‍රවර්ධන කටයුතු වෙනුවෙන් මිලදී ගෙන ත්‍යාග සඳහා ඉදිරිපත් නොවුණු මුළු බර ග්‍රෑම් 692 ක්වූ රන් කාසි හා ස්වර්ණාභාරණ අලෙවි කිරීමට 2022 ජනවාරි 25 දින අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාදී තිබුණි. ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය මඟින් මෙම රන්භාණ්ඩ තොගය සමාලෝචිත වර්ෂයේදී තුන්වරක් තක්සේරු කර ඇති අතර තක්සේරු වටිනාකම රු.15,137,500 සිට රු.12,937,216 ක් දක්වා රු.2,200,284 කින් අඩුවී තිබුණු අතර, තෝරාගත් ගැණුම්කරුට 2022 දෙසැම්බර් 19 දින රු.13,494,000 කට | මෙම රන්භාණ්ඩ අලෙවි කිරීමේ කාර්යය මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය විසින් ලබාදී ඇති ඇස්තමේන්තු පදනම් කර ගනිමින් සිදුකර ඇති අතර එම ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුවූ කාල පරිච්ඡේදය රටේ පැවති විදේශ විනිමය පිළිබඳව ගැටළුකාරී තත්වයක් හේතුකොටගෙන රන් මිල නිතර උච්චාවචනයට ලක්වීම හේතුකොටගෙන විගණනය විසින් දක්වා ඇති පරිදි මිල ගණන් අඩු වීම සිදුවී ඇත.<br>කෙසේ වෙතත් විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් මෙකී රන් භාණ්ඩ අලෙවි කිරීමේ කටයුතු සිදුකර ඇත. | ඉදිරියේදී මෙවැනි තත්ත්වයක් ඇති නොවන ලෙස කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | අලෙවිකර තිබුණි. සමාලෝචිත වර්ෂයේ මැයි මාසයේදී ලද තක්සේරුව මත පදනම්ව අලෙවි කිරීමේ කටයුතු සිදු නොකර, නොවැම්බර් මාසය දක්වා අවස්ථා දෙකකදී මෙම තක්සේරුව වෙනස් කරමින් අලෙවි කිරීමට කටයුතු ප්‍රමාද කිරීම නිසා සංවර්ධන ලොතරැයි මණ්ඩලයට වැඩිපුර රු.1,643,500 ක මුදලක් ලබා ගැනීමට තිබූ අවස්ථාවක් අහිමිවී තිබුණු අතර, අතිරේකව රු.154,560 ක මුදලක්ද දෙවන වර ලංසු කැඳවීමේ පුවත්පත් දැන්වීම් පලකිරීම සඳහා වැය කිරීමටද සිදුවී තිබුණි. | | |
| (ආ) | මණ්ඩලය විසින් 2022 සැප්තැම්බර් 05 දිනැති අංක 2022/09/2005 දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව මඟින් ලග්න වාසනාව ලොතරැයිපත අලෙවි කිරීම වෙනුවෙන් අලෙවි නියෝජිතවරුන්ට දැනට ලබාදෙන රු.3.25 ක කොමිස් මුදලට අමතරව රු.0.50 ක අතිරේක කොමිස් මුදලක් 2022 සැප්තැම්බර් මස 19 දින සිට මාස 03 ක කාලයකට ලබාදීමට තීරණය කර තිබුණි. අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් 2022 දෙසැම්බර් 19 දින සිට එම දිරිදීමනාව ලබාදීම 2023 ජුනි 20 දින දක්වා දීර්ඝ කර තිබුණි. ඒ අනුව 2022 දෙසැම්බර් 31 දින දක්වා මණ්ඩලයේ අරමුදලින් ලග්න වාසනාව ලොතරැයිපත වෙනුවෙන් රු.43,092,258 ක අමතර කොමිස් මුදල් අලෙවි නියෝජිතයන් වෙත ගෙවා තිබුණි. ඒ අනුව ලග්න වාසනාව ලොතරැයිපත වෙනුවෙන් පමණක් අමතර රු.0.50 ක් ගෙවා තිබුණද සැප්තැම්බර් මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා කාලපරිච්ඡේදයේ ලග්න වාසනාව ලොතරැයිපතේ අලෙවියේ වර්ධනය සියයට 18 ක් වුවද, එම කාලපරිච්ඡේදය තුළ අතිරේක කොමිස් මුදලක් නොගෙවන ලද අනෙකුත් ලොතරැයිපත් 04 හි අලෙවියේ වර්ධනය සියයට 16 ත් 30 ත් අතර පරාසයක පැවැති බැවින්, ලග්න වාසනාව ලොතරැයිපත වෙනුවෙන් පමණක් අමතර ශත 50 ක් ගෙවීමෙන් මණ්ඩලය අපේක්ෂා කළ එම ලොතරැයිපත් අලෙවිය ප්‍රවර්ධනය සිදුවී නොමැති බවට නිරීක්ෂණය විය. | එම ලොතරැයිපතෙහි ත්‍යාග රටාවට සමඟ සෘජුව තරඟ කිරීම සඳහා හඳහන නමින් ලොතරැයිපතක් වැඩි අලෙවි නියෝජිත ප්‍රතිලාභ සහ ත්‍යාග ප්‍රතිශතය වැඩිකර තරඟකාරි ආයතනය වෙළඳපලට ඉදිරිපත් කිරීම නිසා ලග්න වාසනාව ලොතරැයිපතෙහි අලෙවියට සෘජුවම බලපාන ලදී. ලග්න වාසනා ලොතරැයි පතෙහි ලක්ෂ 10 ක් පමණ පැවති දෛනික අලෙවිය දිගටම පවත්වා ගෙන යාම සඳහා මෙම අමතර ශත 50 ලබා දෙන ලදී. | සියලුම ලොතරැයිපත්වල අලෙවියේ වර්ධනයක් සිදුවේද යන්න පරීක්ෂා කර ප්‍රවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මණ්ඩලයේ 39 වන සංවත්සරය වෙනුවෙන් ගෙවන ලද එකතුව රු.1,575,000 ක් වූ කාර්ය මණ්ඩල දීමනා ගෙවීම සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | මේ සම්බන්ධව විශේෂ අනුමැතියක් ලබා ගැනීමට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ලිපියක් යොමු කර ඇති අතර ඒ සඳහා අනුමැතිය මේ වන තෙක් ලබා දී නොමැත. | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඈ) | රු.997,500 ක මුදලක් 2022 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදයේදී ඵලදායිව ආයෝජනයක යෙදවීමකින් තොරව ලංකා බැංකුවේ ජංගම ගිණුමක රඳවාගෙන තිබුණි. | මෙම ගිණුමේ අවශ්‍යතාව පිළිබඳව ඉදිරියේදී සමාලෝචනය කර මෙම ගිණුම වසා දැමීම පිළිබඳව තීරණයක් ගැනීමට කටයුතු කරමි. | ගිණුමේ අවශ්‍යතාවය පිළිබඳ අධ්‍යනයක් සිදුකර සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීම. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරුණු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී ලොතරැයි වර්ග 04 කින් E ලොතරැයිපත් 9,497,400 ක් අලෙවි කිරීමට පුරෝකථනය කර තිබූ නමුදු, තත්‍ය වශයෙන් ලොතරැයිපත් 885,675 ක් පමණක් අලෙවි කර තිබුණි. එය ඉලක්ක ගත අලෙවියෙන් සියයට 09 ක් පමණක් වූ අතර, මණ්ඩලයේ සමස්ත ලොතරැයිපත් අලෙවිය වූ ලොතරැයිපත් 606,602,153 න් සියයට 0.15 ක් පමණක් විය. | 2020, 2021 සහ 2022 වර්ෂයන් තුළ වරින් වර රටේ පැවති කොවිඩ් වසංගතය සහ දේශපාලන, ආර්ථික වතාවරණය හේතුවෙන් e-ලොතරැයිපත ප්‍රවර්ධන කටයුතු අඩාල විය. තව ද, මෙම ලොතරැයි App එකට ඇතුළත් වීම පහසුවන ආකාරයට ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ සාකච්ඡා කර නැවත සකස් කිරීම සඳහා අදාළ ආයතනය වෙත උපදෙස් ලබා දුන්න ද එම කටයුතු සිදු නොවීය. මේ හේතුවෙන් එහි ප්‍රවර්ධන කටයුතු මෙම වර්ෂය තුළ සිදු කිරීමට නොහැකි විය. | මෙම ක්‍රමයට ලොතරැයිපත් අලෙවිය සිදුකිරීම පුළුල් කිරීමට වැඩ පිළිවෙලක් යෙදීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | ලොතරැයි ත්‍යාග සඳහා ලබාදීමට ලංකා ස.තො.ස සමාගමෙන් මිලදීගෙන තිබූ වටිනාකම රු.592,500 ක් වූ ත්‍යාග වවුචර් පත් 123 ක් වර්ෂ 13 කට අධික කාලයක් කිසිදු කාර්යක් සඳහා භාවිතා නොකර පැවතිණි. | අදාළ කාරණය සම්බන්ධයෙන් මැදිහත් වී දෙපාර්ශවය අතර සාකච්ඡාවක් සංවිධානය කර ලබා දෙන ලෙස රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්තුමා වෙත 2023 මාර්තු 28 දින ලිපියක් මඟින් ඉල්ලීමක් කර ඇත. | ලංකා ස.තො.ස ආයතනය හා වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර නව වවුචර් පත් හෝ මුදල් ලබාගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරුණු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මණ්ඩලය විසින් 2020 මැයි මාසයේදී ලොතරැයි වර්ග 07 ක් මුද්‍රණය කර සැපයීමට අදාළව ප්‍රසම්පාදන කාර්යයන් ආරම්භ කර තිබූ අතර, ලංසු ලියවිලි සඳහා නිවැරදි ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් අනුගමනය නොකිරීම නිසා ඉන් මාස 06 කට පසුව එනම් 2020 දෙසැම්බර් මාසයේදී එම ප්‍රසම්පාදන කටයුතු අවලංගු කිරීමට සිදුවී තිබුණි. නැවත 2021 පෙබරවාරි මාසයේදී ලොතරැයි වර්ග 08 ක් මුද්‍රණය කර සැපයීම සම්බන්ධයෙන් ප්‍රසම්පාදන කාර්යයන් ආරම්භ කර තිබූ අතර, මණ්ඩලයේ අවශ්‍යතාවය අනුව ලංසු ලේඛන සකස් නොකිරීම හේතුවෙන් ඉන් මාස 11කට පසුව 2022 ජනවාරි 20 දින එම ප්‍රසම්පාදනයද අවලංගු කර තිබුණි. එසේම නැවත 2022 පෙබරවාරි මාසයේදී එම ලොතරැයි වර්ග 08 සඳහා නැවත ප්‍රසම්පාදන කාර්යයන් ආරම්භ කර තිබුණද, 2023 මාර්තු අවසානය දක්වා වර්ෂ 01 මාස 01 ක් ගතවී තිබුණු නමුත්, සැපයුම්කරුවන් තෝරාගෙන ලංසු ප්‍රදානය කිරීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි. ඒ අනුව සංවර්ධන ලොතරැයි මණ්ඩලයට 2020 ජූලි 31 දින සිට 2023 මාර්තු 31 දින තෙක් නිවැරදි ප්‍රසම්පාදනයක් මඟින් ලොතරැයිපත් මුද්‍රණය, සැපයීම සහ ගෙනවිත් භාරදීම සඳහා සැපයුම්කරුවන් තෝරාගැනීමට නොහැකි වී තිබුණි. | 2022 සැප්තැම්බර් 15 දින විවෘත කරන ලද අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව (SCAPC) යටතේ ක්‍රියාත්මක දිනුම් ඇදීමේ ලොතරැයි ටිකට්පත් වර්ග 08 මුද්‍රණයට අදාළ ලංසු පැවරීම 2023 අප්‍රේල් 17 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතියට යටත්ව 2023 අප්‍රේල් 21 දින සිදුකර ඇත. ඒ අනුව, 2023 මැයි 16 සිට 2024 මැයි 15 දක්වා වර්ෂයට අදාළ ලොතරැයි ටිකට්පත් සැපයීම වෙනුවෙන් මෙම ප්‍රසම්පාදනයට අදාළ ලංසු පවරා ඇත. ඒ අනුව, එම ප්‍රසම්පාදනය සාර්ථකව අවසන් කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතු වීම. |
| (ආ) | මණ්ඩලය විසින් 2020 ජූලි 31 දින සිට 2022 වර්ෂය අවසාන වනවිට අවස්ථා 03 කදී ප්‍රසම්පාදන කටයුතු ආරම්භකර තිබුණු නමුත්, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව නිශ්චිත වර්ෂයක් සඳහා ලොතරැයිපත් මුද්‍රණය සඳහා මුද්‍රණකරුවන් තෝරා ගෙන, ඔවුන් වෙත ලංසු ප්‍රදානය කිරීමට අපොහොසත් වීම නිසා, 2020 ජූලි සිට 2022 ජූලි 31 දක්වා කාලපරිච්ඡේදයේදී මාස 01, මාස 02, මාස 03, මාස 04 සහ මාස 06 වැනි කෙටිකාල පරිච්ඡේදවලට ලොතරැයිපත් මුද්‍රණය කරවා ගැනීම සඳහා අවස්ථා 09 කදී පෙර සැපයුම්කරුවන් දෙදෙනා වෙතම රජයේ | රට වසා තිබූ කාලය මෙන්ම මූලිකව දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් සිදුකල ලංසු කැඳවීම අවලංගු කිරීම යන කරුණු ප්‍රසම්පාදන අස්ථිත්වයට පාලනය කල නොහැකි ස්වාධීන සිද්ධින් වේ. එහෙත් මණ්ඩලයේ දෛනික ලොතරැයි මෙහෙයුම් කටයුතු සඳහා ලොතරැයි ටිකට්පත සැපයීම අඛංඩව සිදුකල යුතු අනිවාර්යය කරුණක් වන අතර එසේ නොවුන හොත් අලෙවි ජාලයේ ආදායම් අහිමි වීම තුල විශාල සමාජ ගැටළු පැන නැගීම මණ්ඩලයට විශාල විකුණුම් ආදායම නොලැබීම ප්‍රමුඛ කාරණ වේ. එම | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.14 වගන්තියේ විධිවිධානයන්ට පටහැනිව කාල දිගු ලබා දී තිබුණි. | තත්වය තුල ඒ වන විට පැවති මුද්‍රණ ගිවිසුම දීර්ඝ කිරීම මේ සඳහා ගතහැකි විකල්පය වූ බැවින් ගිවිසුම්ගත දෙපාර්ශවයේ එකඟත්වය මත ඒ ඒ අවස්ථානුකූල ලබා ගෙන ඇති අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පැවති එම ගිවිසුම් කාලය දීර්ඝ කර ඇත. | |
| (ඇ) 2022 පෙබරවාරි මාසයේදී අමාත්‍ය මණ්ඩල ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව යටතේ ආරම්භ කර තිබුණු ලොතරැයිපත් මුද්‍රණය කිරීමේ ප්‍රධාන ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් වී නොතිබීම හේතුවෙන්, 2022 ජූලි 01 දින සිට 2022 සැප්තැම්බර් 30 දින දක්වා මාස 03ක කාලයක් සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 190 ක්වූ ලොතරැයිපත් වර්ග 08ක් මුද්‍රණය කර ගැනීමට දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව මඟින් ජාතික තරඟකාරී ක්‍රමය යටතේ ලංසු කැඳවීම මඟින් ආයතන දෙකක් වෙත මාස 03 ක කාලයට පමණක් ලංසු පැවරීම සිදු කර තිබුණු අතර, මාස 1 ½ , 02 සහ 03 වැනි කෙටි කාලපරිච්ඡේද මඟින් 2023 අප්‍රේල් 15 දින වන විට එකතුව මාස 09 ½ ක කාලයක් ලොතරැයිපත් මුද්‍රණය කරවා ගැනීමට මෙම ආයතන දෙක වෙත කාලය දීර්ඝ කරදී තිබුණි. | අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව (SCAPC) මඟින් ක්‍රියාත්මක ප්‍රසම්පාදනයට අදාළව සැපයුම්කරුවන් තෝරා ගන්නා තෙක් මණ්ඩලයේ දෛනික ලොතරැයි මෙහෙයුම් කටයුතු සඳහා ලොතරැයි ටිකට්පත සැපයීම අඛණ්ඩව සිදුකල යුතු අනිවාර්යය කරුණක් වන අතර එසේ නොවුන හොත් අලෙවි ජාලයේ ආදායම් අහිමි වීම තුළ විශාල සමාජ ගැටළු පැන නැගීම මණ්ඩලයට විශාල විකුණුම් ආදායම නොලැබීම ප්‍රමුඛ කාරණ වේ. එම තත්වය තුළ ඒ වන විට පැවති මුද්‍රණ ගිවිසුම දීර්ඝ කිරීම මේ සඳහා ගතහැකි විකල්ප වන අතර ගිවිසුම්ගත දෙපාර්ශවයේ එකඟත්වය මත ඒ ඒ අවස්ථානුකූල ලබා ගෙන ඇති අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත එම ගිවිසුම් කාලය දීර්ඝ කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතු වීම. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 ඔක්තෝබර් 28 දින පවත්වා තිබුණු වාලම්පුරි 01 වාරය සහිත ලොතරැයිපතේ අලෙවි ආදායම රු.58,799,000 ක්වූ නමුත්, එම ලොතරැයිපතේ ආදායම් ඇස්තමේන්තු 2021 නොවැම්බර් 29 දින සහ 2022 සැප්තැම්බර් 28 දිනයන්හිදී අනුමත කර තිබුණු මුල් අයවැය සහ සංශෝධිත අයවැය ඇස්තමේන්තු දෙකෙහිම ඇතුළත් කර නොතිබුණු බැවින්, එම ලොතරැයිපතේ ආදායම් ඉලක්ක මණ්ඩලය ළඟාකර ගෙන තිබුණේද යන්න විගණනයේදී පරීක්ෂා කළ නොහැකි විය. | උතුරු නැගෙනහිර දමිළ පාරිභෝගික ජනතාව තුළ ලොතරැයි පිළිබඳ තිබෙන්නා වූ විශ්වාසනීයත්වය අඩුවෙමින් පවතින බවක් නිරීක්ෂණය විය. ඔවුන්හට ලොතරැයි පිළිබඳ විශ්වාසය ඔප්නැංවීම උදෙසා ඔවුන් වෙනුවෙන් නව ලොතරැයි පතක් නිකුත් කිරීමට මණ්ඩලය තීරණය කරන ලදී. ඒ අනුව, වාලම්පුරි නමින් දමිළ ලොතරැයි පතක් නිකුත් කිරීමට කටයුතු කරන ලදී. කෙසේ වෙතත්, දමිළ පමණක් නිකුත් කිරීමෙන් ජාතිවාදයට බලපෑමක් විය හැකි හෙයින් එම ලොතරැයි පත සිංහලෙන් ද මුද්‍රණය කරන ලදී. මෙම හඳුන්වා දීම වර්ෂ අවසන් කාර්තුවේ සිදු වූ හෙයින් 2022 අයවැය සඳහා ඇතුලත් නොකෙරුනු අතර 2023 අයවැය සඳහා ඇතුළත් කර ඇත. | නිවැරදිව අයවැය ඇස්තමේන්තු සකස් කිරීමට කටයුතු කළ යුතු වීම. |